---

මඩකලපුව මහා නගර සභාව
මඩකලපුව දිස්ත්‍රික්කය

1 . මූල්‍ය ප්‍රකාශන

1.1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 10 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 අප්‍රේල් 10 දින ඉදිරිපත් කරන ලදී . සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 මැයි 29 දින සභාවේ නගරාධිපතිවරයා වෙත නිකුත් කරන ලදී .

1.2 . මතය .

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, මඩකලපුව මහා නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මඩකලපුව මහා නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

( අ ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ අතැති පොදු ගබඩා තොගයේ වටිනාකම භෞතිකව හරිවැරදි බැලූ වටිනාකමට නොව පොත් අගයට දක්වා තිබුණි.

( ආ ) පුස්තකාල පොත් වල වටිනාකම සොයා දැනගෙන මූල්‍ය ප්‍රකාශනයන් ට ඇතුලත් කර නොතිබුණි.

( ඈ ) මඩකලපුව, දිස්ත්‍රික් ලේකම් වරයා ගෙන් පරිත්‍යාග වශයෙන් ලැබුණු සරඹ ක්‍රීඩා උපකරණ වල වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් කර නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ප්‍රතිසම්පාදනය කිරිම සඳහා මූල්‍ය ප්‍රකාශනයන් හි ප්‍රතිපාදන සලසා නොතිබුණි .

(ඉ) ඉඩම් සහ ගොඩනැගිලි වල වටිනාකම සොයා දැනගෙන මූල්‍ය ප්‍රකාශනයන් හි ඇතුලත් කර නොතිබුණි

## 2 . මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

## 2 .1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.6,236,621 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,524,569 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|
| | රු " 000 | රු " 000 | රු " 000 |
| (i) වරිපනම් සහ බදු | 17,365 | 11,596 | 29,543 |
| (ii) බදු කුලී | 20,220 | 15,875 | 5,411 |
| (iii) බලපත්‍ර ගාස්තු | 5,165 | 4,221 | 4,175 |
| (iv) වෙනත් ආදායම් | 17,613 | 23,140 | 4,635 |

2.2.2 මුද්දර ගාස්තු

------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා ගෙන් සහ අනෙකුත් බලධාරීන් ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු ප්‍රමාණය රු . 14,349,206 ක් විය .

2.3 අවිධිමත් ගනුදෙනු

---------------------

පැරණි සහා ගොඩනැගිල්ලෙන් ගලවා ඉවත් කරන ලද ඇස්බැස්ටෝස් තහඩු 71 ක් සහ දැව කඳන් 28 ක් අනුමැතියකින් තොරව හින්දු කෝවිලකට පරිත්‍යාග කර තිබුණි.

2.4 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් අසාර්ථක වීම

----------------------------------------------

(අ) මඩකලපුව තිරුපරුම්තුරේ විදේශීය පරිත්‍යාගශීලියෙකුගේ සහාය ඇතිව ක්‍රියාත්මක කරන ලද ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියෙන් එම ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ කිසිදු නිෂ්පාදනයක් ලබාගැනීමට නොහැකිව තිබුණු බැවින් එම ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි.

(ආ) ප්‍රදේශයේ පානීය ජලය අපවිත්‍ර වීම නිසා මඩකලපුව, තරුපරුම්තුරේ පිහිටි කසළ බැහැර කිරීමේ භූමිය මගින් එම ප්‍රදේශයේ නිවැසියන්ගේ සෞඛ්‍යයට හානිකර තත්ත්වයක් උද්ගතවී තිබුණි.

3. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතුය .

(අ). ස්ථාවර වත්කම්
(ආ) ගබඩා පාලනය
(ඇ) ආදායම් රැස් කිරීම
(ඈ) සේවක ණය සහ අත්තිකාරම් අය කිරීම
(ඉ) ගිණුම්කරණය
(ඊ) වාහන නඩත්තුව
(උ) තැන්පතු
(ඌ) අයවැය ලේඛණය

s/s .